# Holiday Assignments

**ADVANCE LEVEL**

**Subject: Economics** | **Grade 13** | **Medium: Sinhala**



## සංවර්ධනය

(සංවර්ධනයේ විවිධත්වය තුලනාත්මක ව විග්‍රහ කරමින් තිරසාර සංවර්ධනයට දායකවීමේ ඇල්ම ප්‍රදර්ශනය කිරීම)

10.1 ආර්ථික වර්ධනයේ වැදගත්කම අගයමින් ආර්ථික වර්ධනයට ඉවහල් වන සාධක විශ්ලේෂණය කිරීම

- ◆ ආර්ථික වර්ධනය
  - අර්ථ දැක්වීම
  - තීරක (වර්ධනයට දායක වන සාධක)
    - ■ සම්පත් සම්භාරය, ■ සාධක ඵලදායිතාව, ■ ආර්ථික ස්ථායිතාව,
    - ■ දේශපාලන ස්ථාවරභාවය, ■ යහ පාලනය
- ◆ ආර්ථික වර්ධනය මැනීම
- ◆ ආර්ථික වර්ධනයත් සමඟ ආර්ථික ව්‍යූහය වෙනස් වීම
- ◆ ආර්ථික වර්ධනයේ වැදගත්කම
- ◆ ආර්ථික වර්ධනයේ පිරිවැය

### ආර්ථික වෘද්ධිය

ලෝකයේ සෑම රටක්ම වාර්ෂිකව භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සඳහා විශාල ආයෝජනයක් සිදුකරයි. එමගින් සමස්ථ ආර්ථිකයේ භාණ්ඩ හා සේවා නිමැවුම වර්ධනය වීමේ ක්‍රියාවලිය ආර්ථික වෘද්ධිය ලෙස සැලකිය හැකි වේ. සෑම රටක ම අරමුණ තම තමන්ගේ වාර්ෂික දළ දේශීය හෝ දළ ජාතික නිෂ්පාදිත අගය වර්ධනය කර ගැනීම තුළින් ආර්ථික වෘද්ධිය සහ ආර්ථික වෘද්ධිය අනුපාතිකය ඉහළ මට්ටමකට ප්‍රවේශ කර රටේ ජනතාවගේ භෞතික ජීවන තත්ත්වය වර්ධනය කිරීම යි.

- ⊙ ආර්ථික වෘද්ධිය යනු රටක මූර්ත දළ දේශීය නිෂ්පාදිතය හෝ මූර්ත දළ ජාතික නිෂ්පාදිතය අඛණ්ඩව තිරසාර ලෙස ප්‍රසාරණය වීමේ ක්‍රියාවලිය යි. (යම් රටක මූර්ත නිමවුමේ හෝ විභව නිමවුමේ හෝ භාණ්ඩ හා සේවා නිෂ්පාදන ධාරිතාවයේ හෝ ප්‍රසාරණය වීම ආර්ථික වර්ධනය (ආර්ථික වෘද්ධිය) යනුවෙන් අදහස් වේ.)
- ⊙ උද්ධමන පීඩනයකින් තොර ව ආර්ථිකයකට නිපදවිය හැකි උපරිම තිරසාර නිමැවුම් විභව නිමැවුම හෝ විභව දළ දේශීය නිෂ්පාදිතය ලෙස සැලකිය හැකි වේ.
- ⊙ ආර්ථිකය සතු සියලු ම සම්පත් පවත්නා හොඳ ම තාක්ෂණය යටතේ උපරිම කාර්යක්ෂමතාවයකින් නිෂ්පාදනය සඳහා භාවිතා කරන විට ආර්ථිකයට ලබාගත හැකි උපරිම නිමැවුම් මට්ටම එම ආර්ථිකයේ විභව නිමැවුම වේ. (ආර්ථිකයේ විභව නිමැවුම පූර්ණ සේවා නියුක්ති මට්ටම ලෙස ද හැඳින්වේ)

ආර්ථිකයේ වෘද්ධි ක්‍රියාවලිය ප්‍රස්තාර මගින් ද දැක්විය හැකි වේ.

i. විභව නිමැවුම සහ සැබෑ නිමැවුම් රේඛාව
ii. දිගුකාලීන සමාහාර සැපයුම් වක්‍රය
iii. නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර










(අ) විභව නිමැවුමට වඩා සැබෑ නිමැවුම දෝලනය වෙමින් කෙටිකාලීනව හැසිරෙන අතර විභව නිමැවුම් මට්ටම ප්‍රසාරණය වෙමින් සිදුවූ දිගුකාලීන වෘද්ධිය ආර්ථික වෘද්ධි ක්‍රියාවලියයි.

(ආ) කිසියම් ආර්ථිකයක දිගුකාලීන සමාහාර සැපයුම් වක්‍රය දකුණට විතැන්වීම තුළින් ආර්ථික වර්ධනය පෙන්නුම් කරයි.

(ඇ) නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර දකුනට විතැන්වීම විභව ද.දේ. නිෂ්පාදනය වැඩිවීමක් ලෙස පිළිගත හැකිය.

## ආර්ථික වෘද්ධියට බලපාන සාධක (වෘද්ධියේ තීරක) සම්පත් සම්භාරය ඉහළ යැම

1. භෞතික ප්‍රාග්ධනය
2. මානව ප්‍රාග්ධනය
3. ස්වභාවික ප්‍රාග්ධනයේ වැඩිවීම
4. සමාජ ප්‍රාග්ධනය

## ඵලදායිතාව ඉහළ යැම

(i) තාක්ෂණික දියුණුව
(ii) නව්‍යතා බිහිකිරීම.
(iii) පර්යේෂණ සහ සංවර්ධනය සඳහා කෙරෙන ආයෝජන
(iv) නව්‍යතා බිහිවීම.
(v) කළමනාකරණය දියුණු කිරීම.

මීට අමතරව

(i) ආර්ථික ස්ථායිතාව
(ii) සානුබල
(iii) ව්‍යවසායකත්වයේ වර්ධනය
(iv) යහපාලනය
(v) දේශපාලන සහ සමාජයීය ස්ථාවරයන්

## භෞතික ප්‍රාග්ධනය

- යන්ත්‍ර සූත්‍ර, ගොඩනැගිලි, මාර්ග, වරායන්, ගුවන් තොටුපල, සන්නිවේදන ජාලයන්, ප්‍රවාහන සේවා, වැනි භෞතික ප්‍රාග්ධන උපකරණ සහ මෙවලම් වල සහය නිෂ්පාදනයට ලැබෙනම් එමගින් එක් ශ්‍රමිකයෙකුගේ ප්‍රාග්ධන සම්පත් ප්‍රමාණය ඉහළ යෑමත් ශ්‍රමයේ ඵලදාව ඉහළ යෑමත් අපේක්ෂා කළ හැකි වේ.

## මානව ප්‍රාග්ධනය

- ශ්‍රමිකයා ලබාගන්නා අධ්‍යාපනය, වෘත්තීය පුහුණුව තුළින් ලබාගන්නා දක්ෂතා කුසලතා නිපුණතා මානව ප්‍රාග්ධනය වේ. මානව ප්‍රාග්ධනයේ ආයෝජනය යනු අධ්‍යාපනය සහ සෞඛ්‍ය සඳහා දරන වියදම වේ. කිසියම් රටක මානව ප්‍රාග්ධනය ශක්තිමත් නම් එම රටේ ශ්‍රම ඵලදාව ඉහළ යෑම තුළින් භාණ්ඩ හා සේවා නිෂ්පාදන ධාරිතාව ඉහළ යනු ඇත.

## ස්වභාවික ප්‍රාග්ධනය

- රටකට ස්වභාව ධර්මයෙන් ලැබී තිබෙන සම්පත් වනාන්තර, තෘණ භූමි, ගංගා, දිය ඇළි, සාගරය, දේශගුණික ස්වභාවයන් සහ මීට අමතරව විවිධ ඛණිජ සම්පත් (ගල් අඟුරු, ඛණිජ තෙල් රත්රන්, යපස්) මේවා ශක්තිමත් නම් එම රට තුළ විවිධ නිෂ්පාදන සහ සේවා ක්‍රියාකාරකම් තුළින් භාණ්ඩ හා සේවා නිෂ්පාදනය ප්‍රසාරණය කළ හැකිවේ.

## සමාජ ප්‍රාග්ධනය

- පුද්ගලයන් සහ සමාජය තුළ පවත්නා අන්‍යෝන්‍යතාව, සමාජය තුළ සමාජ කණ්ඩායම්, ආගමික වශයෙන්, ජාතීන් වශයෙන්, කුළ වශයෙන් වෙන්ව සිටීමට වඩා සමාජ කණ්ඩායම් අතර සාමූහිකත්වය තුළින් ඇතිවන සහජීවනය රටක ආර්ථික වර්ධනයට මෙන්ම ආර්ථික සංවර්ධනයට සාධනුබලයක් වනු ඇත.

## තාක්ෂණය

- නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදා ගන්නා විවිධ ශිල්පීය ක්‍රමයන් වේ. එය හටගන්නේ විද්‍යාත්මක සහ කාර්මික ඥාණය තුළිනි. නිෂ්පාදනයට භාවිත කරන ප්‍රාග්ධන හෝ වෙනත් උපකරණවල නව්‍යතාව මත ශ්‍රමයේ ඵලදායිතාව ඉහළ යෑම මෙමගින් අපේක්ෂා කරනු ඇත.

## ව්‍යවසායකත්වය

- රටවල් අතර ව්‍යවසායකත්වයේ වෙනස්කම් හටගනු ඇත. රටවල් කීපයක මෝටර් රථ නිෂ්පාදනය කළත් ව්‍යවසායකත්වයේ කාර්යක්ෂමතාව මත නිෂ්පාදනවල ප්‍රමිතිය, හැඩය, සිත්ගන්නා සුළු නව්‍ය නිෂ්පාදන බිහි වීම ව්‍යවසායකත්ව කාර්යක්ෂමතාව වේ. මෙය රටින් රටට වෙනස් වේ.

## ඉතුරුම් හා ආයෝජනය

- ඉතිරි කිරීමට නම් උපයන ආදායමෙන් කොටසක් පරිභෝජනයට කැප නොකර සිටිය යුතු වේ. එමගින් ඉතිරි කරගන්නා වත්කම් ආයෝජනයක් බවට පත් කෙරෙන අතර එය ප්‍රාග්ධන ආධාරක සහ මෙවලම් බිහි කිරීමට උපකාරී වේ.

## විදේශ ආයෝජන - ණය - ප්‍රදාන

- කිසියම් රටක ට තම රටේ ප්‍රාග්ධනය ප්‍රමාණවත් නොවේ නම්, එය ලබාගත හැකි විකල්ප මාර්ග වන්නේ විදේශ ආයෝජන ආකාර්ෂණය කර ගැනීම. විදේශ ණය ආධාර, වාණිජ ණය, එසේත් නැතහොත් යම් ප්‍රමාණයකට විදේශ පරිත්‍යාග මත ද රටේ ආර්ථික වෘද්ධියක් නිර්මාණය කරගත හැකි වේ.